UPDF
WWW.UPDF.COM

ආයතනයේ නම : වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම් ඇතුලු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

நிறுவனத்தின் பெயர் : வனஜீவராசிகள் பாதுகாப்பு, யானைவேலி மற்றும் அகழிகள் நிருமாணம் உள்ளடங்கலான பாதுகாப்பு நடவடிக்கைகள் மற்றும் காடுகள் மீள் வளர்ப்பு மற்றும் வன வள அபிவிருத்தி இராஜாங்க அமைச்சு

நிலையியற் கட்டளையின் இலக்கம் 119 (4) இன்படி விதிமுறைகளில் பொது கணக்கு குழுவினால் வழங்கப்பட்ட அறிக்கைக்கு ஏற்ப எடுக்கப்பட்ட நடவடிக்கைகளும் மற்றும் கௌரவ அமைச்சர் அவர்களின் அவதானிப்புகளினதும் சமர்ப்பிப்பு

Name of the Institution : State Ministry of Wildlife Protection, Protective Measures Including Construction of Elephant Fences and Trenches and Reforestation and forest Resources Development

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119 (4)

UPDF
WWW.UPDF.COM

ආයතනයේ නම : වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙල හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

රාජ්‍ය ගිණුම් කාරක සභාව මගින් හඳුනාගත් දුර්වලතා	ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
පළමුවන කොටස : 87.00	
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාර 2018.08.01 දිනෙන් පසුව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. මු.රෙ. 134 (3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2022 වර්ෂයේ දී මෙම රාජ්‍ය අමාත්‍යාංශය, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයට ඒකාබද්ධ කරන ලද අතර එතැන් සිට සියලු අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2021 වර්ෂයේ දී පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පැවැත්වීමට සැලසුම් කරන ලද පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි වී ඇත. එහෙත් ඉදිරි වර්ෂවල දී මෙම තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කර ඇත.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අභිතකර මට්ටමේ විය. විගණන වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ලබා දී තිබූ උපදෙස් හා ආකෘති අනුව සකස් කරන ලදි. මෙම මූල්‍ය ප්‍රකාශනය තුළ අන්තර්ගත ඒසිඒ (2) (iii) ආකෘතිය අනුව සියලුම ප්‍රාග්ධන වියදම් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇත. තව ද මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් උපදෙස් ලබා දීමට වැඩමුළුවක් පවත්වන ලද අතර එහිදී ද ප්‍රාග්ධන ගිණුම් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වර්ග කරන ලෙස උපදෙස් ලබා දී ඇත. මෙම ගැටලුව නැවත පැන නොනගින ලෙස 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැකසීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති ආකෘතිවල ප්‍රාග්ධන වියදම් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ පැහැදිලිව සඳහන් කර ඇත.

ඒ. කුමාරසිරි පෙරේරා
ප්‍රධාන මූල්‍ය නිලධාරී
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

කුමාරසිරි පෙරේරා
ප්‍රධාන මූල්‍ය නිලධාරී
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ
අමාත්‍යාංශය
අංක 07, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල 07.

ගුණදාස සමරසිංහ
ලේකම්
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

ගුණදාස සමරසිංහ
වනජීවී හා [illegible] සංරක්ෂණ
අමාත්‍යාංශය